


# සුභාවිත ගී රැසක් එකතු වූ 'සිසිල ගී'




නිව් සවුත් වේල්සයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ 'ලේඛක සංසදය' මගින් නිශ්පාදිත සිංහල ගීත විසි දෙකක් රැගත් 'සිසිල ගී' සංයුක්ත තැටිය පසු ගිය ඔක්තෝබර් මස විසි වන ඉරුදින එළිදක්වන ලදී. රුවැත්තියේ සංයුක්ත තැටියට පසු මෙය සිංහල ලේඛක සංසදය විසින් නිකුත් කරන ලද දෙවන සංයුක්ත ගී තැටියයි.

පසුගිය වසරේ සිංහල ලේඛක සංසදය විසින් 'ගී පද රචනා' පිළිබඳව වැඩමුලු දෙකක් පවත්වන ලදී. පළමු වැඩමුලුවේ ප්‍රධාන දේශකයා වූයේ ප්‍රවීණ ගීත රචක මෛත්‍රී පනාගොඩ ශූරීන්ය. එය නිමවී දෙසතියකට පසු සිඩ්නි නුවරට පැමිණි ශ්‍රී ලංකාවේ සම්මානනීය ගීත රචක සුනිල් සරත් පෙරේරා මහතා විසින්ද 'ලේඛක සංසදයේ' ඇරැයුම පිළිගෙන නිදහස් සිතින් ගී පබඳින්නන් දිරිගන්වනු වස් අගනා දේශනයක් කළේ ය. මේවායේ අවසාන ප්‍රතිඵලය ලෙස මෙසේ 'සිසිල ගී' සිඩ්නි නුවරට සම්ප්‍රාප්ත විය. ප්‍රවීණ සේම ආධුනික ගීත රචකයන් විසි දෙදෙනෙකුගේ ගීත මීට ඇතුළත් වන අතර ප්‍රවීණ සහ නැගී එන නවතම ගායක ගායිකාවන් විසි පස් දෙනෙකු සහ සංගීතඥයන් හය දෙනෙකු මීට දායක වී ඇත.

එළි දැක්වීමේ උළෙල පැවැත් වූයේ සිඩ්නි නුවර කාසල්හිල්හි 'රිබෙලියන්' ශාලාවෙහිදී ය. කලාකරුවන් පිළිගැනීමෙන් පසු ඉතා මනරම් සරස්වතී රංගනයක් ඉදිරිපත් කෙරුනි. මලී දිසානායක ලියූ සරස්වතී ගීතය ගායනය කළේ විශාරද ඉන්දු ප්‍රේමතිලක්ය. මෙහි තනුව සහ සංගීතය සිසිල් ෆොන්සේකාගෙනි. සරස්වතී නර්ථනය පුහුණු කර ඉදිරිපත් කළේ ශ්‍රී ලංකා පර්ෆෝමිං ආර්ට් ඉන්ස්ටිටියුට් හි රාජිණී ෆොන්සේකා නර්ථනාචාර්ය වරියයි.

ලේඛක සංසදය වෙනුවෙන් පිළිගැනීමේ දේශනය කළ ආචාර්ය පාලිත ගනේවත්ත මහතා වසර 1990 දී ඇරැඹි සිංහල සංස්කෘතික හමුව නැමැති වෘක්ෂය දැන් අතු පතර විහිදමින් පල දරන වෘක්ෂයක් බවට පත්වී ඇති බව කියා සිටියේ ය. දෙදහස් නවය නොවැම්බර් මාසයේ ආරම්භ වූ සිංහල ලේඛක සංසදය පසු ගිය වසර හතර තුළ කළ ඉමහත් සේවය ගැන ද ඒ මහතා සඳහන් කළේ ය.

ප්‍රධාන අමුත්තා ලෙස මෙම උත්සවයට සහභාගී වූ සිඩ්නි කොන්සල් බන්දුල ජයසේකර මහතා එම ගීත වලට සවන් දී තමා ඉතා මවිතයට පත් වූ බවත්, මෙතරම් දක්ෂ ගී පද රචකයන්, ගායක ගායිකාවන් සහ සංගීතඥයන් පිරිසක් සිඩ්නි නුවර සිටීම ගැන තමා ආඩම්බරයට පත්වන බවත් සඳහන් කළේය. එම ගීත ඉතාම ඉහළ මට්ටමක ඇති බවත්, ජනප්‍රිය ගායක ගායිකාවන්ගේ ගී ගයමින් තම ප්‍රතිරූපය ප්‍රචාරය කර ගන්නට වෙහෙසෙන ලාංකික තරුවලට මෙම ගී කංචුකය කදිම ආදර්ශයක් බවත් ඉදිරියේදී කෙරෙන මෙවැනි ව්‍යාපෘති සඳහා තම සහයෝගය ඉත සිතින්ම දෙන බවත් ඒ මහතා වැඩි දුරටත් ප්‍රකාශ කර සිටියේය.

ඔවුනට අමතරව ආචාර්ය විජයනන්ද වික්‍රම සාමාප්‍රිය සුමනසේකර සහ ආචාර්ය සිසිල් ෆොන්සේකා යන මහත්වරුන්ද රසිකයන් ලෙසින් තම අදහස් දැක්වූහ. නිවේදන කටයුතු මෙහෙයැවීම ආචාර්ය ලක්ෂ්මන් රන්දෙනිය මහතා සහ ජයන්තා හමුකොටුව මහත්මිය විසින් සිදු කරන ලදී.

ලක්ෂ්මන් කොඩිතුවක්කු





කැලණි කොත්තු සාජ්ජය 2013

www.kuaa.com.au

නොවැම්බර් 23 සෙනසුරාදා සවස 7.00 ට

ටයර් හන්දියේත් නෙවෙයි
පට්ටිය හන්දියේත් නෙවෙයි
තොරණ හන්දියේත් නෙවෙයි
ගිය පාර වගේ ක්ලේටන් හන්දියෙත් නෙවෙයි
මෙදා පාර මවුන්ට්වේවලි හන්දියේ
පුස්තකාලයට අල්ලපු හෝල් එකේ

**Mount Waverley Youth Centre 45 Miller Cres. Mount Waverley**

SATURDAY 23rd November at 7.00 PM, Next to Mt. Waverley Library Melway: 70 E1 Dress: Casual

පොඩ්ඩන්ටත්, ලොක්කන්ටත් සෙල්ලම්, සින්දු කියන්න, අහන්න විතරක් නෙවෙයි කැමති නම් නටන්නත් පුළුවන්. නැත්නම් තෙල් බැම්මේ වගේ ඉඳගෙන තෙලක් බෙදන්නත් පුළුවන්. තවත් පොඩි ආරංචියක්.... නත්තල් සීයා තෑගිත් අරන් 8.30ට විතර එනවලු.

එක්කෙනෙකුට ඩොලර් 10. අවුරුදු 12 ට අඩු දරුවන්ට නොමිලේ. කැලණිය විශ්ව විද්‍යාලයෙන් ඇවිල්ලා, මෙහෙ ඉගෙන ගන්න අයට සහ පවුලේ අයට නොමිලේ. පවුලේ කට්ටියත් එක්ක එදාට පරක්කු නොවී, හවස 7.00 වෙනකොට එන්න. හැමෝගෙම පහසුවට ටිකට් කලින් ගත්තොත් මරු. ටිකට් ගන්නයි, විස්තර දැන ගන්නයි, ජයන්තිට නැත්නම් සුලාලිට කතාකරන්න. එහෙමත් නැත්නම් ඊමේල් එකක් දාන්න kelaniuni@hotmail.com.

ජයන්ති 9807 2034 සුලාලි 0478 937 826

Open to families of past students and staff of University of Kelaniya and its affiliated institutes only

Scan for Google Map